**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අන්තර්මධ්‍ය විභාගය - ජූලි 2014

## (54) ගිණුම්කරණය හා පාලන පද්ධති

(Accounting & Control Systems)

---

## A - කොටස

### බහුවරණ ප්‍රශ්න

**ප්‍රශ්න අංක 01 - ලකුණු 30**

**(අනිවාර්ය ප්‍රශ්නයකි.)**

A - කොටස බහුවරණ ප්‍රශ්න 15 කින් සමන්විත ය. මේ සඳහා ප්‍රමාණවත් ලකුණු වැඩි දෙනෙක් ලබාගැනීමට සමත්ව ඇත. පිලිතුරු මගින්, A. ගිණුම්කරණ ප්‍රමිත පිලිබඳ දැනුම, B. මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම පිලිබඳ අවබෝධය, C. කාරක ප්‍රාග්ධනය පිලිබඳ අවබෝධය, D. බැංකු සැසඳුම් පිලියෙල කිරීම පිලිබඳ දැනුම, E. මූල්‍ය තත්ත්වය මැනීම F. ගිණුම්කරණ සංකල්ප, G,I, අනුපාත පිලිබඳව දැනුම, H. ශේෂ පිරික්ෂුම පිලිබඳව අවබෝධය, J. ගිණුම්කරණ සමීකරණ පිළිබඳව දැනුම, K. අභ්‍යන්තර පාලන පද්ධතියක අරමුණු ගැන දැනුම, L. අභ්‍යන්තර විගණක පත්කිරීම, M. නිශ්චිත පාලන පටිපාටි අවබෝධය, N. විගණන මතය ප්‍රකාශ කිරීම, හා O. බැංකු ශේෂ සත්‍යාපනය කෙරෙන අයුරු ආදී විෂය දැනුම පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න යොමුකර ඇත.

වැඩි ලකුණු රැස් කරගත හැකි මෙම ප්‍රශ්නයට අවබෝධය හා දැනුම ඇතිව පිලිතුරු සපයන ලද අපේක්ෂකයින් සාර්ථකව මුහුණ දී ඇත. බහුවරණ ප්‍රශ්න සඳහා පිලිතුරු, ප්‍රශ්න පත්‍රයේ ම ලියා අමුණා ඇති එක් අපේක්ෂකයෙක් විය.

විෂය නිර්දේශය වැඩි කොටසක් ආවරණය වන අයුරින් ප්‍රශ්නය සැකසී ඇත. පිලිතුරු සැපයීමේ දී A, C, D, F, G, H, I, J ප්‍රශ්න සඳහා වැඩි දෙනෙක් සාර්ථක පිළිතුරු සපයා ඇත. E, O, ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී 75% කට නිවැරදි පිළිතුර සැපයීම දුෂ්කර වී ඇත. K, L, M, N, විගණන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සැපයීමට 95%ක්ම සමත්ව ඇත. O. බැංකු ශේෂ සත්‍යාපනය කෙරෙන ආකාරය ප්‍රායෝගික විගණන දැනුම ඇති අපේක්ෂකයින් පමණක් නිවැරදි පිළිතුර ඉදිරිපත් කර ඇති බව පෙණිනි. ප්‍රශ්නය තෝරා නොගත් පිලිතුරු සැපයීමට උත්සාහ නොකළ අපේක්ෂකයින් දෙදෙනෙක් ද විය.

## B - කොටස

**ප්‍රශ්න අංක 02 - ලකුණු 25**

**(අනිවාර්ය ප්‍රශ්නයකි.)**

සීමිත සමාගම් පිළිබඳ මූලික දැනුම හා ගිණුම් තැබීම ආශ්‍රිතව කොටස් නිකුත් කිරීම, ප්‍රසාද කොටස් නිකුතුව, තොග හානි ගැලපීම, වත්කම් විකිණීම, බැංකු සැසඳුම්, ආදායම් බදු ගැලපීම ආදී ගැලපිලි ඇතුලත් කර ඒවා ගිණුම් තැබීම සම්බන්ධයෙන් ප්‍රශ්නය යොමුව ඇත. අපේක්ෂකයින් බොහොමයක් පිළිතුරු සපයා තිබුණි. මුළු ලකුණු 25 උපයා ගත් අපේක්ෂකයින් විය. සෑම අපේක්ෂකයෙක් ම පිලිතුරු සැපයීමට උත්සාහ දරා තිබිණි. සමාගම් ගිණුම් 'කළමණාකරණයේ භාවිතය සඳහා' විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය) පිළියෙල කරන ලෙස ඉල්ලා ඇත.

සමස්ථයක් වශයෙන් ගත් කල පිලිතුරු සැපයීම පිලිබඳ සෑහීමකට පත්විය නොහැකි ය. ගිණුම්කරණය පිළිබඳ මූලික දැනුම නොමැතිවීම අපේක්ෂකයින් ගේ දුර්වලතාවයක් වේ. මෝටර් රථ විකුණුම් ගැලපුම විසඳීමේ දී වර්ෂයේ ක්ෂය පිළිබඳව අවධානය යොමු කර නැත. තොග ගණනය, හානි පිලිබඳ සටහන් සහ ක්ෂය ගැලපීම් පිලිබඳ ගිණුම්කරණ ප්‍රමිත වලට අදාල අයුරින් පෙන්වීමට බලාපොරොත්තු වේ. තොග හානි හා වන්දි ගණනය නිවැරදිව අදාල සටහන් තබා නැත. ආදායම් බදු ගැලපුම නිවැරදිව සටහන් කර නැත. ගැලපුම් විසඳීමේ දී හර, බැර සටහන් පිළිබඳ මූලික අවබෝධය අපේක්ෂකයින්ට ලබා දිය යුතුව ඇත. පොදු සංචිතයට මාරු කිරීම, ලාභාංශ ගෙවීම වැනි දෑ ඉදිරිපත් කළ යුතු ලාභාලාභ ගිණුමේ ද, ශේෂ පත්‍රයේ ද යන්න පැහැදිලි නැති බැවින් සමහර අපේක්ෂකයින් එය ආදායම් ප්‍රකාශය සමග ඉදිරිපත් කර ඇත. ලකුණු 12 කට වඩා ලබාගත් අපේක්ෂකයින් 50% ක් පමණ විය. ලකුණු 0 – 5 අතර ලබාගත් ඉතා දුර්වල අපේක්ෂකයින් ද විය.

මූලික ගිණුම්කරණ මූලධර්ම, නව ගිණුම්කරණ ප්‍රමිත, නව සමාගම් පණත පිලිබඳව අවබෝධය ලබා ගත යුතු ය. වත්කම් ඉවත් කිරීම සම්බන්ධයෙන් (LKAS 16) හා තොග ගණනය සම්බන්ධව (LKAS 2) විශේෂිතව මෙහිදී සැළකිය යුතු ය.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 25**
**(අනිවාර්ය ප්‍රශ්නයකි.)**

තනි පුද්ගල ව්‍යාපාරයක් හවුල් ව්‍යාපාරය බවට පත් කිරීම. නිවැරදිව ගලපා එදිනට හවුල්කරුවන් යොදන මුදල හා පෙර මාස 6 ට අදාල ලාභ කොටස ප්‍රාග්ධනිත කර ගැලපීම් නිවැරදිව නො ගැලපීම නිසාත්, වැටුප් නිවැරදිව කාල පදනමට ගණන් බලා සටහන් නො කිරීම නිසාත්, ජංගම හා ප්‍රාග්ධන ගිණුම සඳහා අදාල සටහන් පිලිබඳ අවබෝධය නොමැති නිසාත් වෙන් කළ ලකුණු උපයා ගැනීම අසීරු වී තිබුණි. හවුල් කරුවෙකුට හිමි ප්‍රසාද දීමනාව ගණනය කර ලාභාලාභ ගිණුමේ පළමු මාස 6ට අදාලව සටහන් කර ගෙවිය යුතු ප්‍රසාද දීමනා වශයෙන් ජංගම වගකීම්වල පෙන්නුම් කිරීම නිවැරදිව කර තිබුනේ අපේක්ෂකයින්ගෙන් 2%ක් පමණ වේ. ණය පොලිය නිවැරදිව ලාභාලාභ ගිණුමේ සටහන් නොකළ අපේක්ෂක සංඛ්‍යාව 75%ක් පමණ වේ. පළමු මාස 6ට අදාල මෙය ඉතා සරල ගැලපීමක් වුවත් තේරුම් ගැනීමට සමත්ව නැත.

දළ ලාභය හා ලාභාලාභ ගිණුම සටහන් තීරු ක්‍රමයට නියමිත පදනමින් ගලපා පෙන්වීමට ලකුණු වෙන්කර ඇත. වෙළඳ ගිණුම ද තීරු ක්‍රමයට සකස් කිරීමට ඇතැම් අපේක්ෂකයින් පෙළඹී තිබුණි. විකුණුම් පදනම අනුව හා කාල පදනම අනුව වියදම් බෙදා දක්වා ගිණුම් පෙන්වීමේ තීරණය අනුව කටයුතු නොකිරීම නිසා ලකුණු අහිමි විය. තීරු ක්‍රමයට ලාභා ලාභ ගිණුම පෙන්වීම වැඩි දෙනෙක් නිවැරදිව ඉදිරිපත් කළත් ගැලපුමේ සඳහන් පරිදි ආදායම් සහ වියදම් බෙදා පෙන්වීමේ නිවැරදි ක්‍රමවේදය තෝරාගෙන නැති අවස්ථා ද විය. ලාභ විසර්ජනය හා නිවැරදි වැටුප් ගණනය සඳහා හිමි ලකුණු අපේක්ෂකයින්ගෙන් වැඩිදෙනෙක් ලබාගැනීමට සමත්ව නැත.

## C - කොටස

**ප්‍රශ්න අංක 04 - ලකුණු 10**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

(A) කොටස සඳහා ලකුණු 06 ක්ද, (B) කොටස සඳහා ලකුණු 04 ක්ද වශයෙන් ලකුණු 10 ක් මෙම ප්‍රශ්නයට වෙන් කර ඇත. A කොටස අනුපාත ගණනය කිරීම පිලිබඳව දැනුම විමසීමට පිලියෙල වී තිබුණි. දී ඇති වගුවෙන් අදාල සංඛ්‍යා තෝරා ගෙන අනුපාත ගණනය කර ප්‍රමාණවත් ලකුණු ලබාගැනීමට වැඩි දෙනෙක් සමත් විය. දෙමළ මාධ්‍යයන් පිලිතුරු සැපයීම පිලිබඳව සෑහීමට පත්විය නො හැකි ය. සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය අපේක්ෂකයින් අනුපාත ගණනය කිරීම නිවැරදිව කර ඇත. 'තොග පිරිවැටුම් අනුපාතය' (Inventory Turnover Ratio) සහ 'තොග රැඳවුම් කාලය' (Stock Resident Period)වැඩි දෙනෙක් නිවැරදිව ගණනය කර නැත. ඉදිරිපත් කිරීම හා සූත්‍ර පිලිබඳව දැනුම වර්ධනය කරගත යුතු වේ. අනුපාත විශ්ලේෂණය ප්‍රතිශත වශයෙන් ඉදිරිපත් කළ යුතු කොටස් නිවැරදිව ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින් වගබලා ගත යුතුව ඇත.

B කොටස සඳහා දී ඇති 'එකතු කළ අගයමත බදු පාලන ගිණුම' (VAT) අවබෝධයෙන් සකසා පිලිතුරු සපයා ලකුණු ලබා ගැනීමට වැඩි දෙනෙක් සමත් ව ඇත. මෙම ගිණුම නිවැරදිව පිළියෙල කළයුතු ආකාරය, එහි අන්තර්ගතය පිලිබඳ ව ඇතැම් අපේක්ෂකයින් අවබෝධයෙන් තොරව දුර්වල පිලිතුරු ඉදිරිපත් කර තිබේ. ගිණුම් සටහන් අපේක්ෂිත අයුරින් නිවැරදිව ඉදිරිපත් කර ශේෂය නිවැරදිව ලබා ගැනීමට උත්සාහ කළ යුතුය. තෝරා ගැනීමේ දී වැඩි සිසුන් පිරිසක් තෝරාගත් ප්‍රශ්නයයි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

(A) කොටස සඳහා ලකුණු 04 ක්ද, (B) කොටස සඳහා ලකුණු 06 ක්ද, වශයෙන් ලකුණු 10 ක් මෙම ප්‍රශ්නය සඳහා නියමිත ය. අස්තිත්වයක අභ්‍යන්තර පාලන පද්ධතිය අවබෝධ කර ගැනීම සඳහා යොදාගත හැකි ක්‍රම දෙකක් පැහැදිලි කිරීම ඉල්ලා ඇත. වැඩි අපේක්ෂක සංඛ්‍යාවක් නිවැරදි පිලිතුර සැපයීමට සමත්ව නැත. වැඩි දෙනෙක් මෙම ප්‍රශ්නය මඟහැර ඇත. පිලිතුරු සපයන ලද අපේක්ෂකයින් බහුතරයකගේ ඇගැයීම් මට්ටම ඉතා දුර්වලය. පාලන පරිසරය හා පාලන පරිපාටි පිළිබඳව අර්ථ දක්වා ඇත.

(B) විකුණුම් ණයගැතියන් සම්බන්ධයෙන් කළමණාකරණය විසින් යොදා ගත හැකි අභ්‍යන්තර පාලන මිණුම් හයක් (6) ඉල්ලා ඇත. එය නිවැරදිව, ඍජුව පෙන්වීමට බොහෝ අපේක්ෂකයින් සමත්ව නැතත් තරමක් දුරට සාර්ථක පිළිතුරු විය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිලිතුරු දුන් අපේක්ෂකයින් සාර්ථකව පිලිතුරු සපයා තිබිණි. විෂය පිලිබඳ ප්‍රායෝගික අවබෝධය ලබාගත යුතු අතර දැනුම පංති කාමරයට සීමා නො කළ යුතු වේ.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 10**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

(A) කොටස සඳහා ලකුණු 04 ක්ද, (B) කොටස සඳහා ලකුණු 04 ක්ද, (C) කොටස සඳහා ලකුණු 02 ක්ද වශයෙන් ලකුණු 10 ක් මෙම ප්‍රශ්නය සඳහා ලැබේ. (A) කොටස සඳහා "අභ්‍යන්තර විගණනය හා බාහිර විගණනය" වෙන්කොට හඳුනා විගණක පත් කිරීම හා විගණනයේ අරමුණ දක්වන ලෙස ඉල්ලා ඇත. සාර්ථක පිළිතුරු සපයා නැත. විගණක පත් කිරීම සම්බන්ධව අපේක්ෂක අවබෝධය ප්‍රමාණවත් ය. අරමුණු පිළිබඳව න්‍යායාත්මක දැනුම ඉතා දුර්වල මට්ටමක විය.

(B) කොටස සඳහා ගිණුම්කරණ පාලන වල අරමුණු හතරක් (04) බලාපොරොත්තු වේ. නිවැරදි පිලිතුරු දීමට හැකිව නැත. මූල්‍යමය පාලන උපක්‍රම පිළිබඳව න්‍යායාත්මක දැනුම ඉතා අල්ප විය. අභ්‍යන්තර පාලන උපක්‍රම බොහෝ අපේක්ෂකයින් විශ්ලේෂණය කර තිබුණි. අර්ථය නිසි පරිදි ඉදිරිපත් කරමින් පිලිතුරු දී නැත.

(C) "අකරණ දෝෂ" සහ "කරණ දෝෂ" වෙන්කොට හඳුන්වා දැක්වීම අපේක්ෂා කරයි. ලකුණු දෙකක් සඳහා කෙටි පැහැදිලි පිලිතුර ඉදිරිපත් කිරීමට නැඹුරු විය යුතු ය. වැඩි දෙනෙක් ඉහළ මට්ටමක ලකුණු ලබාගෙන නැත. සම්පූර්ණ ලකුණු ලබාගත් අපේක්ෂකයින් ද විය. ඉතා දුර්වල අවබෝධයක් මත පිලිතුරු ලියා ඇත. අපේක්ෂකයින් ගේ න්‍යායාත්මක දැනුම වැඩි දියුණු කිරීම කළ යුතු වේ.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. ප්‍රශ්න පත්‍රයේ දී ඇති **"අයදුම්කරුවන්ට උපදෙස්"** නිවැරදිව කියවීම හා පිළිපැදීම.
2. සම්පූර්ණ විෂය නිර්දේශය හොඳින් අධ්‍යයනය කර තිබීම.
3. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.
4. විෂය නිර්දේශයට අදාල නව ගිණුම්කරණ ප්‍රමිත (LKASs සහ SLFRSs) පිළිබඳ දැනුවත් වීම.
5. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.
6. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.
7. සෑම ප්‍රශ්නයකටම අදාල පෙරවැඩ පැහැදිලිව පෙන්වා ඒවා පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතුය.

\- * * * -